ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாட்டுத் திணைக்களம்
DOMESTIC OPERATIONS DEPARTMENT

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

චක්‍රලේඛ අංක : 2021 අංක 01

2021 මැයි 21

**සියලුම සහභාගිත්ව ආයතන වෙත**

**වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහාවන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 ඔක්තෝබර් 31 දක්වා විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම් සම්බන්ධයෙන් සහභාගිත්ව ආයතන වෙත නිකුත් කරන ලද සියලුම මෙහෙයුම් උපෙදස්/චක්‍රලේඛ ඇතුළත් කරමින්, 2016 නොවැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලද වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් අංක 35/03/016/007/001 හා සම්බන්ධවයි.

විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් මේ දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛ ඒකාබද්ධ කරමින් “වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්” චක්‍රලේඛනය සංශෝධනය හා යාවත්කාලීන කර ඇත.

ඒ අනුව, සියලුම සහභාගිත්ව ආයතන 2021 ජුනි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි යාවත්කාලීන කරන ලද වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහාවන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් (චක්‍රලේඛ අංක:2021 අංක 01) සඳහා අනුකූල වීම මෙමඟින් අවශ්‍ය වේ.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

චක්‍රලේඛ අංක : 2021 අංක 01

# වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන
# ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

1.0 2016 ඔක්තෝබර් 31 දක්වා විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් සහභාගිත්ව ආයතන වෙත නිකුත් කරන ලද සියලුම මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛන ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 නොවැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි "වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛනය" නිකුත් කරන ලදී. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් (බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලද සමාගම්) සහ සේවක අර්ථසාධක අරමුදල සහභාගිත්ව ආයතන ලෙස හඳුන්වනු ලැබේ.

2.0 විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 මැයි මස 20 දක්වා නිකුත් කරන ලද පහත සඳහන් මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛන (වගන්ති අංක 3.0 පරිදි) ඒකාබද්ධ කරමින් "වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛනය" සංශෝධනය කර ඇත . ඒ අනුව, පහත දක්වා ඇති මෙහෙයුම් උපදෙස්/චක්‍රෙල්ඛ ඉවත් කරනු ලබන අතර, 2021 ජුනි 01 දින සිට වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන නව ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

3.0 ඒකාබද්ධ කරන ලද චක්‍රලේඛන

| | චක්‍රලේඛ අංකය | නිකුත් කරන ලද දිනය | මාතෘකාව |
|---|---|---|---|
| 1 | 35/03/016/007/001 | 2016 නොවැම්බර් 01 | වෙළඳපොළ මෙහෙයුම් කටයුතු මත වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් |
| 2 | 35/03/021/0013/001 | 2018 අගෝස්තු 23 | ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු |
| 3 | 35/03/016/007/002 | 2019 පෙබරවාරි 14 | වෙළඳපොළ මෙහෙයුම් කටයුතු මත වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් |
| 4 | 35/03/016/007/003 | 2019 සැප්තැම්බර් 05 | විවට වෙළඳපොළ කටයුතු සඳහා වන සංශෝධිත කාලසටහන |
| 5 | 35/03/016/007/004 | 2019 සැප්තැම්බර් 05 | විවට වෙළඳපොළ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි |
| 6 | 35/03/021/0013/002 | 2019 සැප්තැම්බර් 05 | විවට වෙළඳපොළ කටයුතු යටතේ බැංකු නොවන ප්‍රාථමික |

| | | | |
|---|---|---|---|
| | | | අලෙවිකරුවන් හට ද්‍රවශීලතා ආධාරක පහසුකම සැපයීම සඳහා වන මෙහෙයුම් උපදෙස් |
| 7 | 35/03/021/0013/003 | 2019 සැප්තැම්බර් 05 | ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු |
| 8 | 35/03/016/007/005 | 2020 පෙබරවාරි 11 | විවට වෙළඳපොළ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි |
| 9 | 35/03/016/007/006 | 2020 ජූනි 29 | විවට වෙළඳපොළ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සඳහා පවතින පද්ධතිය තුළ හඳුන්වා දෙන ලද නවීකරණ |

## 1 වන කොටස : හැඳින්වීම

4.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී අනුපාතික කොරිඩෝව (Standing Rate Corridor), එනම් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) ස්ථායීව පවත්වා ගැනීම සඳහා සහභාගිත්ව ආයතන සමග විවට වෙළඳපොළ කටයුතු පවත්වනු ලබයි. කෙසේ වෙතත්, විවට වෙළඳපොළ කටයුතු යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පමණක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලබන අතර, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලැබේ. නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව සහ ඉහළ සීමාව පිළිවෙළින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව වසරකට අට වතාවක් විවරණය කරනු ලබන අතර, අවශ්‍ය සංශෝධන සිදු කරනු ලබයි.

5.0 මුදල් වෙළඳපොළ දෛනික හා කෙටිකාලීන ද්‍රවශීලතා ඇස්තමේන්තු, වෙළඳපොළ වර්ධනයන් සහ ප්‍රතිපත්ති වාතාවරණය පදනම් කරගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් වෙළඳපොළට ද්‍රවශීලතාව ලබාදිය යුතු ද, වෙළඳපොළෙන් ද්‍රවශීලතාව අවශෝෂණය කළ යුතු ද යන්න සහ එසේ සිදු කරයි නම් භාවිතා කළ යුතු උපකරණ වර්ගය, ප්‍රමාණය සහ පරිණත කාලය තීරණය කරනු ලබයි.

6.0 i. එක් එක් කාණ්ඩය යටතේ දක්වා ඇති පරිදි විවට වෙළඳපොළ කටයුතු අනුව සහභාගිත්ව ආයතනවලට පහත සඳහන් උපකරණ සඳහා ප්‍රවේශය හිමි වේ.

අ. කෙටිකාලීන වෙන්දේසි

අ. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

ආ. කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ආ. දිගුකාලීන වෙන්දේසි

අ. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

ආ. දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ඇ. ද්‍රවශීලතා ආධාරක පහසුකම

අ. කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම

ආ. දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම

ඈ. ස්ථිර පදනමක් මත වූ වෙන්දේසි

අ. ස්ථිර පදනමක් මත සුරැකුම්පත් අලෙවි කිරීමේ වෙන්දේසි

ආ. ස්ථිර පදනමක් මත සුරැකුම්පත් මිලදී ගැනීමේ වෙන්දේසි

ඉ. ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් හා සම්බන්ධ ගනුදෙනු

අ. වෙන්දේසි ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම

ආ. වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම

ඇ. ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නැවත මිලදීගැනීමේ (Buy-back) පහසුකම

ඊ. විදේශ විනිමය හුවමාරු ගනුදෙනු

අ. ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම්

ආ. විකුණුම්-ගැනුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම්

ii. නිත්‍ය පහසුකම් යටතේ සහභාගිත්ව ආයතනවලට පහත සඳහන් උපකරණ සඳහා ප්‍රවේශය හිමි වේ.

අ. නිත්‍ය තැන්පතු පහසුකම

ආ. නිත්‍ය ණය පහසුකම

## 2 වන කොටස : සහභාගිත්ව ආයතන සඳහා පොදු උපදෙස්

7.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය (OEBS) සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය (CIMM) භාවිතා කොට වෙළඳපොළට නිවේදනය කරනු ලබයි. නිත්‍ය පහසුකම හැර අනෙකුත් පහසුකම් ලබාදීමේදී විවට වෙළඳපොළ කටයුතු පැවැත්වීම සඳහා වෙන්දේසි ක්‍රමය භාවිතා කරනු ලැබේ. පහත ඡේදයෙහි සඳහන් අවස්ථාවක හැර අනෙකුත් සෑම අවස්ථාවන්හිදී සහභාගිත්ව ආයතනවලට තම ගනුදෙනු/ලංසු විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය හරහා ඉදිරිපත් කළ හැක.

8.0 යම්කිසි සහභාගිත්ව ආයතනයක්හට කාර්මික දෝෂයක් හේතුවෙන් විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියට ප්‍රවේශ විය නොහැකි අවස්ථාවකදී ලංසුවට අදාළව ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන විස්තර දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශයට දුරකථන මාර්ගයෙන් එම අදාළ වෙන්දේසිය පැවැත්වෙන කාලසීමාව තුළදී හෝ

නිත්‍ය පහසුකමක් නම් එය නිම වීමට බලාපොරොත්තු වන කාලසීමාවට පෙර, අදාළ පරිදි දැනුම් දිය යුතුය. එසේ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කරන ලංසු, වෙන්දේසීන් හෝ නිත්‍ය පහසුකම් යටතේ වන වටිනාකම අදාළ කාලසීමාව නිමාවී විනාඩි 15 ක් ඇතුළත බලයලත් නිලධාරීන් දෙදෙනෙකුගේ අත්සන සහ කාර්මික දෝෂයේ ස්වභාවය විස්තර සහිතව දක්වමින් ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මගින් දැනුම් දිය යුතුය. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එම ගනුදෙනුව පද්ධතියට ඇතුළත් කිරීම සඳහා අදාළ සියලුම තොරතුරු එවැනි ගනුදෙනුවක/ලංසුවක ඇතුළත් විය යුතුය. සහභාගිත්ව ආයතනය විසින් ලබාදෙන ලද තොරතුරු මත පදනම්ව එවැනි ගනුදෙනුවක්/ලංසුවක් එම ආයතනය වෙනුවෙන් අදාළ පද්ධතියට ඇතුළත් කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් ලෙස එම නිවේදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලනු ඇත. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද වැරදි හෝ අසම්පූර්ණ තොරතුරු හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අයැදීම ප්‍රතික්ෂේප කළ හැක. ඉහත සඳහන් කාලසීමාවට පසු ඉදිරිපත් කෙරෙන (ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මාර්ගයෙන්) කිසිදු ලංසුවක් භාරගනු නොලැබේ. එම පණිවිඩයේ මුල් පිටපත එදිනම, දිනයේ ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලැබීමට සැලැස්විය යුතුය.

9.0 මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි කාණ්ඩ 4, 5 සහ 6 විධිවිධාන යටතේ, සහභාගිත්ව ආයතනයක් ශ්‍රී ලංකා මහ බැංකුව සමග ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා සහභාගි වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමග සහභාගිත්ව ආයතන එළඹී ඇති ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම්හි සඳහන් වන කොන්දේසීන්ට යටත් වනු ඇත. ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම්හි සඳහන් කොන්දේසි, මෙම මෙහෙයුම් උපදෙස්හි සඳහන් කොන්දේසිවලට සමාන වේ.

10.0 මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් කාණ්ඩ 3 විධිවිධාන යටතේ සහභාගිත්ව ආයතනයක්, ශ්‍රී ලංකා මහ බැංකුව සමග කෙරෙන නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ සහභාගිත්ව ආයතන එළඹ ඇති නිත්‍ය පහසුකම සඳහා වන ප්‍රධාන ගිවිසුමෙහි කොන්දේසිවලට යටත් වේ. නිත්‍ය පහසුකම සඳහා වන ප්‍රධාන ගිවිසුමෙහි සඳහන් වන කොන්දේසි මෙම මෙහෙයුම් උපදෙස්වල එපරිදිම වේ.

11.0 සහභාගිත්ව ආයතනවලට පෙර දැනුම්දීමකින් අනතුරුව, මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි කිසියම් නියමයක් සහ හෝ කොටසක් වෙනස් කිරීමේ, අලුත් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

12.0 ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම හා/හෝ ප්‍රධාන නිත්‍ය පහසුකම් ගිවිසුම සමග මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් අතර යම් පරස්පර බවක් හෝ නොගැලපීමක් පවතින විට මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

13.0 ඉදිරිපත් කරන මිල ගණන් අවමය රුපියල් මිලියනයක් (රු.1,000,000.00) විය යුතු අතර, එම මිල ගණන් රුපියල් මිලියනෙහි ගුණාකාර විය යුතුය.

14.0 විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියේ යම් කාර්මික දෝෂයක් නිසා කිසියම් ආයතනයකට මින් මතුව විස්තර කෙරෙන ගනුදෙනුවලට අදාළව තහවුරු කිරීමේ පිටපතක්/පිටපත් ලබාගත නොහැකි වූ විටක දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ ඉල්ලීම පරිදි පිටපතක්/පිටපත් ෆැක්ස් කරනු ලැබේ.

15.0 යම් ගනුදෙනුවක්/ලංසුවක් වෙන්දේසියට ඉදිරිපත් කරන විට, එම ගනුදෙනුව/ලංසුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා ගනු ලබන සුරැකුම්පතෙහි මුහුණත අගය, එම සුරැකුම්පතට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල ගැනුම් මිල පදනම් කොටගෙන පද්ධතිය විසින් ස්වයංක්‍රීයව ගණනය කරනු ලබයි. මෙම නිල මිල ගණන් ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතියේ සටහන්ව ඇති අතර විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියෙන් ද ලබාගත හැක.

16.0 සහභාගිත්ව ආයතනයකට යම් ගනුදෙනුවක්/ලංසුවක් සඳහා ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් (ISIN) ඕනෑම සංඛ්‍යාවක් යොදා ගත හැකිය. නිත්‍ය ණය පහසුකම් ගනුදෙනුවකට හෝ ප්‍රතිවිකුණුම් ලංසුවකට, එකට වඩා වැඩි ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් සංඛ්‍යාවක් පවරා ඇත්නම් අවසාන පියවීමේ කටයුතුවලදී එකී සුරැකුම්පත් වෙනම ගනුදෙනුවක්/ලංසුවක් ලෙස සැලකේ.

17.0 අලාභ ප්‍රතිපූර්ණය

අ. සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව පියවීම් දිනයේදී ලංසුවක්/ගනුදෙනුවක් සම්පූර්ණ කිරීමට අසමත් වීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනයක ගනුදෙනුවක්/ලංසුවක් භාරගත් පසු, එම ගනුදෙනුව සම්පූර්ණ කිරීමට සහභාගිත්ව ආයතනය බැඳී සිටියි. යම් ලෙසකින් අදාළ සහභාගිත්ව ආයතනය ගනුදෙනුව පියවීම් දිනයේ ලංකාසෙක්‍යුහි ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම, පියවීම් ගිණුමේ හෝ සහභාගිත්ව ආයතනය ස්වකීය ගිණුමේ (own account) ප්‍රමාණවත් අරමුදල් හෝ ප්‍රමාණවත් සුරැකුම්පත් තැබීමට අසමත් වුවහොත්, අදාළ ගනුදෙනුවෙහි පොලී ආන්තිකය හානි පූර්ණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය. මෙම හානිය පූර්ණය සඳහා වූ මුදල, ගනුදෙනු පියවීම් දිනට පසුව එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේදී අදාළ සහභාගිත්ව ආයතනයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති පියවීම් ගිණුමට හර කරනු ලැබේ.

ආ. සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව කල්පිරෙන දිනයේදී එය පියවීම පැහැර හැරීම.

යම්කිසි සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව කල්පිරෙන දිනයේදී (ආපසු ගෙවන දිනයේදී) ලංකාසෙක්‍යු පද්ධතියෙහි ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම, ආපසු

විකුණුම් වටිනාකම (මිලදීගත් වටිනාකම සහ පොලී ආන්තිකය) ගෙවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් තම පියවීම් ගිණුමෙහි පවත්වා ගැනීමට අපොහොසත් වුවහොත් ආපසු විකුණුම් වටිනාකමට අමතරව ආදළ ගනුදෙනුවෙහි හානිය සඳහා වූ පොලී ප්‍රමාණය, හානි පූර්ණයක් ලෙස එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයෙන් එකකට (0.1%) සමාන වූ ගෙවීම් පැහැර හැරීම සඳහා වූ හානි පූර්ණයක්, ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට අදාළ සහභාගිත්ව ආයතනය බැඳී සිටී.

ඇ. ඉහත ආ තුළින් හට ගන්නා මුදල්, ගනුදෙනු පියවීමේ දිනයට පසුව එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති අදාළ සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට හර කරනු ලැබේ.

ඈ. ලිත් වර්ෂයක් තුළ සහභාගිත්ව ආයතනයක් විසින් එක් වරකට වඩා ලංසුව/ගනුදෙනුව එකඟ වූ පරිදි සිදු නොකිරීම හෝ එම ගනුදෙනුව නිසි පරිදි පියවීම පැහැර හැරීම

සහභාගිත්ව ආයතනයක් ලිත් වර්ෂයක් තුළ ලංසුව/ගනුදෙනුව එක් වරකට වඩා එකඟ වූ පරිදි සිදු නොකළ විට, එම සහභාගිත්ව ආයතනයට, ශ්‍රී ලංකා මහ බැංකුව සමග එවැනි ගනුදෙනු කිරීමට ලබාදී ඇති පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කළ හැකිය. සහභාගිත්ව ආයතනයක් විසින් ලිත් වර්ෂයක් තුළ තුන් වරකට වඩා ගනුදෙනු නිසි පරිදි පියවීම පැහැර හැරීම සිදු කළ හොත්, ගෙවීම් පැහැර හැරීමේ පොලී අනුපාතිකය, එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයේ දෙකක් (0.2%) දක්වා ඉහළ නැංවීම හෝ එකී සහභාගිත්ව ආයතනයට ශ්‍රී ලංකා මහ බැංකුව සමග එවැනි ගනුදෙනු කිරීමට ලබාදී ඇති පහසුකම, මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කිරීමට කටයුතු කළ හැකිය.

18.0 සහභාගිත්ව ආයතනයකට වෙන්දේසියේ අදාළ කාලසීමාව නිම වූ පසු කිසිදු හේතුවක් මත, ඉදිරිපත් කරන ලද ලංසුවක් සංශෝධනය කළ නොහැක.

19.0 ශ්‍රී ලංකා මහ බැංකුව සාමාන්‍යයෙන් පවත්වන වෙන්දේසිවලට අමතරව, අවශ්‍ය යැයි හැඟී යන්නේ නම් එකම දිනය තුළදී අතිරේක වෙන්දේසි පැවැත්විය හැක.

20.0 සහභාගිත්ව ආයතනයක, ඕනෑම ලංසුවක්/ගනුදෙනුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

21.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නිල ගැනුම් සහ විකුණුම් මිල ගණන්, වර්තමාන වෙළඳපොළ මිල ගණන් හා එහි වෙනස්වීම් මත පදනම්ව දෛනිකව ගණනය කෙරේ.

22.0 ගනුදෙනුව කල්පිරීමට නියමිත දිනය, රජය හදිසියේ ප්‍රකාශ කළ බැංකු නිවාඩු දිනයක් වන්නේ නම්, යම් පාර්ශ්වයක් හා අදාළව එදිනට නියමිත වූ ගනුදෙනුව පිළිබඳව කටයුතු කිරීම ඊළඟට එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේදී සිදු කරනු ඇත.

23.0 විවට වෙළඳපොළ කටයුතු සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ සාරාංශයක් ඇමුණුමේ දක්වා ඇත.

24.0 නිත්‍ය තැන්පතු පහසුකම හැර අනෙකුත් සියලු කටයුතු ගෙවීමට එදිරි මුදාහැරීමේ (Delivery Versus Payment) පදනම මත සිදු කරනු ලබයි.

25.0 කඩඉම් මිල යටතේ සාර්ථක ලංසු එකකට වඩා ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී ඉදිරිපත් කර ඇති ලංසුවල වටිනාකමට සමානුපාතික වන පරිදි (Pro rata basis) ලංසු තැබූ ආයතන වෙත අරමුදල් ප්‍රදානය කරනු ලැබේ. ඒ අනුව කඩඉම් මිල යටතේ ඉදිරිපත් කර ඇති ලංසුවල මුළු ප්‍රමාණයෙන් කිසියම් කොටසක් පමණක් පිළිගැනීමක් සිදු වනු ඇත.

26.0 දෛනික ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව, ලංකාසෙට්ල් පද්ධති නීති (LankaSettle System Rules) 4 කාණ්ඩයෙහි සහ ලංකාසෙට්ල් පද්ධති නීති 2.1 පිටපතෙහි සංශෝධිතයන්ට අනුව හෝ එහි නවතම පිටපතෙහි නිරූපිත පරිදි වේ. සාමාන්‍යයෙන්, ලංකාසෙක්‍යුවර් (LankaSecure) ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව 16:30 පැය වේ. කෙසේ වෙතත්, අනපේක්ෂිත අවස්ථාවන් හමුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් කාරක සටහනට අවස්ථානුකූල වෙනස්කම් සිය අභිමතය පරිදි සිදු කරයි. මෙවන් අවස්ථාවකදී, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව වෙනස් කොට එය සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ඇත.

27.0 සහභාගිත්ව ආයතන විසින් පියවීමේ උපදෙස් ලබාදීම අවශ්‍ය නොවේ.

28.0 නිත්‍ය ණය පහසුකම (SLF), කෙටිකාලීන ප්‍රතිවිකුණුම් (STRRP), දිගුකාලීන ප්‍රතිවිකුණුම් (LTRRP) සහ ද්‍රවශීලතා ආධාරක පහසුකම් (LSF) ගනුදෙනු හා සම්බන්ධව ඉදිරිපත් කළ සුරැකුම්පත් ආදේශ කිරීමට අවසර නොලැබේ.

29.0 සහභාගිත්ව ආයතනවලට දේශීය මෙහෙයුම් සඳහා වූ එක්දින ප්‍රතිමිලදීගැනුම් ගිණුමේ (Domestic Operations Repurchase Account – DOP) ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක.

## 3 වන කොටස: නිත්‍ය පහසුකම

30.0 සියලුම සහභාගිත්ව ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තැන්පත් කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ද අදාළ සුරැකුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු අරමුදල් ණයට ගැනීම සඳහා නිත්‍ය ණය පහසුකම ද දෛනික පහසුකම් ලෙස භාවිතා කළ හැක. නිත්‍ය පහසුකම යටතේ තැන්පත් කරන හෝ ණයට ගන්නා අරමුදල් ප්‍රමාණය එකී

ආයතනයන්ගේ අභිමතය මත සිදු වේ. නිත්‍ය තැන්පතු පහසුකම/නිත්‍ය ණය පහසුකම යටතේ සහභාගිත්ව ආයතන විසින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා තැන්පත් කරන/ඉල්ලුම් කරන ප්‍රමාණය සම්බන්ධ සම්පූර්ණ වගකීම ආදාළ සහභාගිත්ව ආයතනය සතුවේ. අදාළ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු මහ බැංකුව විසින් අනුමත කළ පසු, කිසිදු හේතුවක් මත, එසේ ඉදිරිපත් කරන ලද ලංසුවලට කිසිදු සංශෝධනයක් සිදු කළ නොහැකි වේ.

### 3.1: නිත්‍ය තැන්පතු පහසුකම

31.0 නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන අදාළ ගනුදෙනුව 15:30 පැයට පෙර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය වෙත ඉදිරිපත් කළ යුතුය.

32.0 නිත්‍ය තැන්පතු පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය වන අතර, එයට අදාළ පොලී ප්‍රමාණය තැන්පතුව පවත්වා ගෙන යනු ලබන කාලසීමාවට අනුව ගණනය කරනු ඇත.

33.0 ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන විසින් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමට බලාපොරොත්තු වන අරමුදල් ප්‍රමාණය එම ආයතනවල පියවීම් ගිණුම්වලින් ලංකාසෙට්ල් පද්ධති නීතිවල දෛනික මෙහෙයුම් කාලසටහන අනුව එදිනම සෘජුවම හර කරනු ලැබේ.

34.0 ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල බ්‍රවුසර් එක හරහා සහභාගිත්ව ආයතන විසින් සිය පියවීම් ගිණුමෙහි අදාල හර වටිනාකම තහවුරු කිරීමක් කරනු ලැබේ. .

35.0 නිත්‍ය තැන්පතු පහසුකමෙහි තැන්පත් කරනු ලැබූ මුදලට සමාන මුදලක් ගිණුමට හර වූ බවට තහවුරු කිරීමට, FIN 900 යටතේ තහවුරු කිරීමේ අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) හරපත් පණිවිඩය අදාළ ගිණුම් හිමියාට යවනු ලැබේ.

36.0 කල්පිරෙන දිනයේදී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 08:30 පැයට හෝ ඊට ප්‍රථම, මූලික තැන්පතු අගය සහ අදාළ පොලිය සහභාගිත්ව ආයතනයෙහි පියවීම් ගිණුමට බැර කරනු ලැබේ.

37.0 කල්පිරෙන දිනයේදී, 08:30 පැයට හෝ ඊට ප්‍රථම, ඉහත මුදල ගිණුමට බැර වූ බවට තහවුරු කිරීමට FIN 910 යටතේ තහවුරු කිරීමේ අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) බැරපත් පණිවිඩය අදාළ ගිණුම් හිමියාට යවනු ලැබේ.

### 3.2 නිත්‍ය ණය පහසුකම

38.0 ප්‍රතිවිකුණුම් ගනුදෙනු මූලධර්ම මත නිත්‍ය ණය පහසුකම ක්‍රියාත්මක වේ. නිත්‍ය ණය පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සහ/හෝ භාණ්ඩාගාර බැඳුම්කර යම් එකඟ වූ මිලකට (ප්‍රතිමිලදීගැනුම් මිල/ආපසු විකිණීමේ මිල) යම් එකඟ වූ දිනයකදී ආපසු විකිණීමේ ගිවිසුමක් මත සහභාගිත්ව ආයතනයන්ගෙන් මිලදී ගනු ලැබේ.

39.0 ප්‍රතිමිලදීගැනුම් මිල ආදළ සුරැකුම්පතෙහි ගැනුම් මිල සහ අදාළ ගනුදෙනුවෙහි පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ.

40.0 නිත්‍ය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය වන අතර එය අදාළ ණය මුදල් ලබාගන්නා කාලසීමාව සඳහා ගණනය කරනු ඇත.

41.0 නිත්‍ය ණය පහසුකම ලබාගැනීමට බලාපොරොත්තු වන ආයතන එම ගනුදෙනු සහ ඊට අදාළ සුරැකුම්පත්වල විස්තර 15:30 පැයට පෙර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය වෙත ඉදිරිපත් කළ යුතුය.

42.0 ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (අයදුම් කළ ප්‍රමාණය) බැර කිරීමෙන් සහ ලංකාසෙක්‍යුර් (LankaSecure) ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් සඳහා වූ ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදී ගත් සුරැකුම්පත් ලැබීමත් සමග එදිනම 16:15 වන විට ගනුදෙනුව පියවනු ලැබේ.

43.0 පිළිගත් වටිනාකම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත්, මුහුණත අගයන්, එලදා අනුපාතිකය සහ පරිණත දිනය සහිතව නිත්‍ය ණය පහසුකම් ගනුදෙනුවේ තහවුරුවක් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ සහභාගිත්ව ආයතනයට විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය ඔස්සේ එදිනම 16:15 වන විට ඉදිරිපත් කරනු ලබයි.

44.0 පරිණත වන දිනයේදී, සුරැකුම්පත්වල නැවත විකුණුම් අගයට (ප්‍රතිවිකුණුම් මිලට) අදාළ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම, එදින 11:00 පැය වනවිට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙක්‍යුර් (LankaSecure) සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලට ගත් සුරැකුම්පත් හුවමාරු කිරීම සිදු කරයි.

## 4 වන කොටස : කෙටිකාලීන වෙන්දේසි

45.0 කෙටිකාලීන වෙන්දේසි ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු යන දෙයාකාරයට සිදු වේ. කෙටිකාලීන වෙන්දේසිවල කාල සීමාව දිනක සිට දින 7 ක් (සතියක්) දක්වා වේ. මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් වගන්ති 5.0 හි සඳහන් ආකාරයට වෙළඳපොළ මෙහෙයුම්

කමිටුව, වෙන්දේසියට අදාළ කාල සීමාව සහ එහි ප්‍රමාණය තීරණය කරනු ලබයි. විවට වෙළඳපොළ වෙන්දේසි පිළිබඳ පියවීම් කටයුතු එදිනම පියවීමේ පදනම මත (T+0) සිදු වේ.

46.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය එදින 09:30 පැය වන විට නිවේදනය කරනු ලබයි. මෙම නිවේදනයෙහි ඉදිරිපත් කර ඇති වෙන්දේසිය වර්ගය (කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්), ඉදිරිපත් කළ වටිනාකම සහ පරිණත වන දිනය (කාලය) ඇතුළත් වේ. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි ඇමුණුම යටතේ දක්වා ඇති 'විවට වෙළඳපොළ කටයුතු සඳහා යොදා ගැනෙන උපකරණ සහ කාලසටහන' අනුව පැවැත්වේ.

47.0 එක් වෙන්දේසියක් සඳහා උපරිම වශයෙන් සහභාගිත්ව ආයතනයකට ලංසු 3 ක් ඉදිරිපත් කළ හැකි අතර, ලංසුවල මුළු වටිනාකම එම වෙන්දේසියෙහි වටිනාකමට සීමා වේ. එක් එක් ලංසුවෙහි තම තමන් ආයෝජනය කිරීමට හෝ ණයට ලබා ගැනීමට බලාපොරොත්තු වන වටිනාකම සහ අනුරූපව ලංසු තබන පොලී අනුපාතිකය සඳහන් විය යුතුය.

48.0 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම්, කෙටිකාලීන ප්‍රතිවිකුණුම් සහ කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසීන්හි ප්‍රතිඵලය, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් මුළු ප්‍රමාණයත්, බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ සාර්ථක ලංසුවක උපරිම හා අවම අනුපාතිකයන් වැනි තොරතුරු සඳහන් කරමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතනවලට වෙන්දේසියේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප, පිළිගත් හෝ කොටසක් පමණක් පිළිගත් ලංසු) අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30 ක කාලයකට පසු නිවේදනය කරනු ලබයි. විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවේදනය කරනු ලබයි.

49.0 එක් එක් සාර්ථක ලංසු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල විකුණුම් මිල ගණන් භාවිතා කොට කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි සඳහා සරිලන පරිදි සුරැකුම්පත් වෙන් කිරීම සිදු කරනු ලබයි. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම්, කෙටිකාලීන ප්‍රතිවිකුණුම් හා කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසි සඳහා ගනුදෙනුව සාර්ථක වූ සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් ප්‍රතිඵල නිකුත් කර පැයක් ඇතුළත දී, විද්‍යුත්මය ගනුදෙනු තහවුරු කිරීමක් නිකුත් කරනු ලැබේ. මෙම තහවුරුව තුළ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය (අංක) සහ අදාළ මුහුණත වටිනාකම (වටිනාකම්), අදාළ වෙන්කිරීම් (කොටස් වශයෙන් පිළිගැණුනු ලංසුවකට අදාළව නැවත ගණනය කරන ලද මුහුණත වටිනාකම), පිළිගත් ප්‍රමාණය සහ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වටිනාකම්වලින් සමන්විත වේ.

## 4.1 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

50.0 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසියෙහි ආයෝජනය කිරීමට කැමති සහභාගිත්ව ආයතන තම ලංසුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය මගින් අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට හෝ ඊට ඉහළ අනුපාතිකයකට ඉදිරිපත් වන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

51.0 අදාළ වෙන්කිරීම් සිදු කෙරෙන්නේ සාර්ථක ලංසු තබන්නන් විසින් ඉදිරිපත් කළ ලංසුවල පොලී අනුපාතිකයන්ගේ ආරෝහණ පිළිවෙළටය.

52.0 ගනුදෙනු පියවීම, ලංකාසෙට්ල් (LankaSettle) හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (Matched Trade Feed (MTF)) පහසුකම යටතේ සිදු කරනු ලැබේ. අලෙවි කළ සුරැකුම්පත්වල විකුණුම් වටිනාකම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට අරමුදල් (පිළිගත් ප්‍රමාණය) ලැබීමත් සමග ඒ සඳහා ලබාදිය යුතු සුරැකුම්පත් අදාළ සහභාගිත්ව ආයතනයෙහි දේශීය මෙහෙයුම් ගිණුමට (DOP) මාරු කිරීමෙන්, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් 13:15 පැය හෝ ඊට පෙර ගනුදෙනු පියවනු ලබයි.

53.0 වෙන්දේසියේ සාර්ථක වූ සහභාගිත්ව ආයතන විසින් මිලදීගත් සුරැකුම්පත්වල වටිනාකම (පිළිගත් ප්‍රමාණය) පියවීම සඳහා 13:15 වන විට පියවීමේ ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු වේ.

54.0 විකුණන ලද සුරැකුම්පත් කල්පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යුහි (LankaSecure) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වකීය (Own Account) ගිණුමට හෝ දේශීය කටයුතු ණය ගිණුමට (Domestic Operations Borrowed Account – DOB) ලැබීමත් සමග, 08:30 පැය හෝ ඊට පෙර අදාළ ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, සහභාගිත්ව ආයතනයන්හි පියවීමේ ගිණුමට ගෙවනු ලැබේ.

55.0 ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) සහ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු සඳහා පොලී අනුපාතිකය මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. පිළිගත් ප්‍රමාණය, සහභාගිත්ව ආයතනයෙහි එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම්ව පොලී ප්‍රමාණය ගණනය කළ යුතු වේ.

56.0 සහභාගිත්ව ආයතන විසින් කල් පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනුව සම්පූර්ණයෙන් ප්‍රතිවර්තනය කිරීම සඳහා 08:30 පැය වන විට ලංකාසෙක්‍යුහි (LankaSecure) දේශීය කටයුතු ප්‍රතිමිලදීගැනුම් ගිණුමෙහි (DOP) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිළිගත් සුරැකුම්පත් රඳවා තබා ගැනීමට වගබලා ගත යුතුය.

### 4.2 කෙටිකාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු

57.0 කෙටිකාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු වෙන්දේසියෙහි ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විසින් ඔවුන්ගේ ලංසු, ස්ථාපිත කර ඇති විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය මගින් අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. සහභාගිත්ව ආයතන සිය ලංසුව සමග ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකයන් ඉදිරිපත් කළ යුතුය. නිත්‍ය තැන්පතු අනුපාතිකය හෝ ඊට පහළ අනුපාතිකයන්ට ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

58.0 ආදළ වෙන්කිරීම් සිදු කරනු ලබන්නේ සාර්ථක ලංසු තබන්නන් ඉදිරිපත් කළ මිල අනුපාතිකයන්ගේ අවරෝහණ පිළිවෙළටය.

59.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම යටතේ එදිනම 13:15 පැයට සිදු කරනු ලැබේ. ලංකාසෙක්‍යුහි ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදීගත් සුරැකුම්පත් ප්‍රමාණය ලැබීමත් සමග ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) බැර කරනු ලැබේ.

60.0 කල්පිරෙන දිනයේදී (ප්‍රතිවිකුණුම් දිනයේදී) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදීගත් සුරැකුම්පත්වල ආපසු විකිණීම් වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම මහ බැංකුව ලංකාසෙක්‍යුහි ඇති සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලදීගත් සුරැකුම්පත් 11:00 පැයට පෙර නැවත මාරු කරනු ලැබේ.

61.0 නැවත විකිණීමේ වටිනාකම සුරැකුම්පතෙහි මිලදීගත් වටිනාකම (පිළිගත් වටිනාකම) සහ අදාළ ලංසුවේ පොලී ආන්තිකයෙන් සමන්විත වේ. අදාළ ලංසුවේ පොලී ආන්තිකය පිළිගත් වටිනාකම සහ ගිවිසුමට අනුව සහභාගිත්ව ආයතනවල ලංසුවේ කාලසීමාව සහ ඊට අදාළ පොලී අනුපාතිකය පදනම් කොටගෙන ගණනය කරනු ලැබේ.

## 5 වන කොටස : දිගුකාලීන වෙන්දේසි

62.0 දිගුකාලීන වෙන්දේසි ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලින් සමන්විත වේ. දිගුකාලීන වෙන්දේසිවල කාලසීමාව දින 7 කට වඩා (සතියකට වඩා) වැඩි වේ.

63.0 පැය 09:30 වනවිට, දිගුකාලීන වෙන්දේසියක් පැවැත්වීම සම්බන්ධයෙන්, වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ හෝ ඊට පෙර වැඩකරන දිනයේදී මහ බැංකුව විසින් නිවේදනය කරනු ලැබේ. පවත්වනු ලබන වෙන්දේසි වර්ගය (දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් හෝ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක වෙන්දේසි), සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම, පරිණත වන දිනය (කාලසීමාව),

වෙන්දේසිය පවත්වනු ලබන දිනය සහ පියවීම් කටයුතු සිදුවන දිනය මෙම නිවේදනයේ ඇතුළත් වේ.

64.0 එක් වෙන්දේසියක් සඳහා උපරිම වශයෙන් සහභාගිත්ව ආයතනයකට ලංසු 6 ක් ඉදිරිපත් කළ හැකි අතර, ලංසුවල මුළු වටිනාකම එම වෙන්දේසියේ වටිනාකමට සීමා වේ. සෑම ලංසුවකම ඔවුන් විසින් ආයෝජනය/ණයට ගැනීමට බලාපොරොත්තු වන වටිනාකම සහ ඊට අදාළ පොලී අනුපාතික සඳහන් කළ යුතුය. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසි ඇමුණුම යටතේ දක්වා ඇති කාලසටහන සහ විවට වෙළඳපොළ කටයුතු යටතේ වන උපකරණවල සාරාංශය අනුව පැවැත්වේ.

65.0 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසීන්හි ප්‍රතිඵලය, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් මුළු ලංසු ප්‍රමාණය, බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ සාර්ථක ලංසුවල උපරිම හා අවම අනුපාතිකයන් වැනි තොරතුරු සඳහන් කරමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතනවලට වෙන්දේසියේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප, පිළිගත් හෝ කොටසක් පමණක් පිළිගත් ලංසු) අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30 ක කාලයකට පසු නිවේදනය කරනු ලබයි.

66.0 එක් එක් සාර්ථක ලංසු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල විකුණුම් මිල ගණන් භාවිතා කොට දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, වෙන්දේසි සඳහා ඊට සරිලන පරිදි සුරැකුම්පත් වෙන්කිරීම සිදු කරනු ලබයි. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් යන වෙන්දේසි සඳහා ගනුදෙනුව සාර්ථක වූ සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් ප්‍රතිඵල නිකුත් කර පැයක් ඇතුළත දී, විද්‍යුත් ගනුදෙනු තහවුරු කිරීමක් නිකුත් කරනු ලැබේ. මෙම තහවුරුව තුළ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය (අංක) වෙන්කරන ලද අදාළ මුහුණත වටිනාකම/වටිනාකම්, පිළිගත් ප්‍රමාණය, ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ප්‍රතිවිකුණුම් වටිනාකම සහ පරිණත වන දිනය යන තොරතුරුවලින් සමන්විත වේ.

## 5.1 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

67.0 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසියකට සහභාගිවීමට අපේක්ෂා කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් ඔවුන්ගේ ලංසු අදාළ වෙන්දේසි නිවේදනයට අනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා දැනුම් දිය යුතු වේ.

68.0 සාර්ථක ලංසු තබන්නන් විසින් ලබාදුන් පොලී අනුපාතික ආරෝහණ ක්‍රමයට සකසා ඒ මත පදනම්ව අදාළ වෙන්කිරීම් සිදු කරනු ලබයි.

69.0 පියවීම් දිනයේදී ලංකාසෙට්ල් පද්ධතියේ සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) හරහා ගනුදෙනු පියවනු ලැබේ. අලෙවි කළ සුරැකුම්පත්වල විකුණුම් වටිනාකම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට අරමුදල් (පිළිගත් ප්‍රමාණය) ලැබීමත් සමඟ ඒ සඳහා ලබාදිය යුතු සුරැකුම්පත් අදාළ සහභාගිත්ව ආයතනයෙහි දේශීය මෙහෙයුම් ගිණුමට (DOP) මාරු කිරීමෙන් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් 8.30 පැය හෝ ඊට පෙර ගනුදෙනුව පියවනු ලබයි.

70.0 ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවට සුරැකුම්පත්හි විකුණුම් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) සම්පූර්ණයෙන් අයකර ගැනීමට හැකිවන පරිදි වෙන්දේසියේදී සාර්ථක වූ සෑම සහභාගිත්ව ආයතනයක්ම පියවීම් දිනයේදී පැය 08:30 වන විට ප්‍රමාණවත් ශේෂයක් තම පියවීම් ගිණුමේ පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.

71.0 විකුණන ලද සුරැකුම්පත් කල්පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යුහි (LankaSecure) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වකීය (Own Account ගිණුමට හෝ දේශීය කටයුතු ණය ගිණුමට (Domestic Operations Borrowed Account – DOB) ලැබීමත් සමග, 08:30 පැය හෝ ඊට පෙර අදාළ ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, සහභාගිත්ව ආයතනයන්හි පියවීමේ ගිණුමට ගෙවනු ලැබේ.

72.0 ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) සහ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු සඳහා පොලී අනුපාතිකය මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. පිළිගත් ප්‍රමාණය, සහභාගිත්ව ආයතනයෙහි එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම්ව පොලී ප්‍රමාණය ගණනය කළ යුතු වේ.

### 5.2 දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

73.0 දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළින් මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා තම ලංසු අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. සහභාගිත්ව ආයතන තමන් විකිණීමට බලාපොරොත්තු වන සුරැකුම්පත් ප්‍රමාණය, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් ප්‍රමාණය ද ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

74.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කළ ලංසුවල පොලී අනුපාතිකවල අවරෝහණ පිළිවෙළට වෙන්කිරීම් සිදු කරනු ලබයි.

75.0 ගනුදෙනුව පියවීම ඊළඟ ව්‍යාපාරික දිනයේදී ලංකාසෙට්ල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම යටතේ එදිනම 08:30 පැයට හෝ ඊට ප්‍රථම සිදු කරනු ලැබේ. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යු පද්ධතියෙහි ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ

දේශීය මෙහෙයුම් ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) පිළිගත් සුරැකුම්පත් ප්‍රමාණය ලැබීමත් සමග සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) බැර කරනු ලැබේ.

76.0 කල්පිරෙන දිනයේදී (නැවත විකුණුම් දිනය) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගත් සුරැකුම්පත්වල ආපසු විකිණීමේ වටිනාකම (ප්‍රතිමිලදීගැනුම් මිල) ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම ලංකාසෙක්‍යුයෙහි ඇති සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලදී ගත් සුරැකුම්පත් 11:00 පැයට ප්‍රථම නැවත මාරු කරනු ලැබේ.

77.0 නැවත විකිණීමේ වටිනාකම, සුරැකුම්පතෙහි මිලදී ගත් වටිනාකම (පිළිගත් වටිනාකම) සහ අදාළ ලංසුවේ පොලී ආන්තිකයෙන් සමන්විත වේ. අදාළ ලංසුවේ පොලී ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ පිළිගත් වටිනාකම සහ ගිවිසුමට අනුව අදාළ සහභාගිත්ව ආයතනයේ ලංසුවේ කාලසීමාව සහ අදාළ පොලී අනුපාතිකය පදනම් කොටගෙනය.

**6 වන කොටස: ද්‍රවශීලතා ආධාරක පහසුකම**

78.0 බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කර ඇති සමාගම් එනම් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ ද්‍රවශීලතා ආධාරක පහසුකමක් හඳුන්වා දෙනු ලැබේ. බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන මෙම ද්‍රවශීලතා ආධාරක පහසුකම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් පවත්වන අවස්ථාවේදී හෝ මහ බැංකුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී ලබාදෙනු ඇත.

79.0 ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ අරමුදල් ලබාගැනීමට බලාපොරොත්තු වන බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවේදනය කර ඇති අදාළ වෙන්දේසිය යටතේ ඔවුන්ගේ ලංසුව/ලංසු ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ ලංසු, සුරැකුම්පත් තොරතුරු සමග එනම් ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක වැනි තොරතුරු ඇතුළත්ව ඉදිරිපත් කළ යුතුය.

80.0 එදින බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පවත්වනු ලැබූ ප්‍රතිවිකුණුම් වෙන්දේසියේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ලංසුවලට අදාළ වූ උපරිම ලංසු අනුපාතිකය පදනම් කොටගෙන ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ වන වෙන්දේසිය සඳහා අවම ලංසු අනුපාතිකය තීරණය කරනු ලබයි. ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ වෙන්දේසියක් ආරම්භ කිරීමට ප්‍රථම ඊට අදාළ වන අවම ලංසු අනුපාතිකය මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය සහ විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අවම අනුපාතිකයට (Floor Rate) වඩා අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ලංසුවක් පිළිනොගැනේ.

81.0 සාර්ථක ලංසු තබන්නන් විසින් ඉදිරිපත් කරන ලංසුවල පොලී අනුපාතිකයන්හි අවරෝහණ පිළිවෙළ පදනම් කරගනිමින් වෙන්දේසියෙහි අදාළ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

82.0 ද්‍රවශීලතා ආධාරක පහසුකම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සුරැකුම්පත් වෙනුවට වෙනත් සුරැකුම්පත් ආදේශ කිරීමට අවසර නොලැබේ.

83.0 ගනුදෙනු පියවීම, එදිනම 13:15 පැය හෝ ඊට පෙර සිදු කරනු ලැබේ. ලංකාසෙක්‍යු පද්ධතියේ ඇති දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ දේශීය මෙහෙයුම් සඳහා ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදී ගත් සුරැකුම් ප්‍රමාණය ලැබීමත් සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුගේ පියවීම් ගිණුමට මිලදීගත් සුරැකුම්පත් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) හර කරනු ලැබේ.

84.0 පරිණත වන දිනයේදී, (අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරු විසින් නැවත ප්‍රතිවිකුණුම් කරන දිනය) සුරැකුම්පත්වල ආපසු විකුණුම් වටිනාකමට අදාළ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීමේ ගිණුමට ලැබීමත් සමගම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 11:00 පැය ඉක්මවීමට පෙර මිලදී ගත් සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ඇති බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සුරැකුම්පත් ගිණුමට හුවමාරු කිරීම සිදු කරයි.

85.0 ප්‍රතිමිලදීගැනුම් මිල, සුරැකුම්පත් මිලදීගැනුම් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) සහ අදාළ ලංසුව සඳහා වන පොලී අනුපාතික මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. අදාළ ලංසුවෙහි පොලී ප්‍රමාණය පිළිගත් ලංසුවේ ප්‍රමාණය, අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම් කරගෙන ගණනය කරනු ලබයි.

## 7 වන කොටස : ස්ථිර පදනම මත වෙන්දේසි

86.0 ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර විකිණීමට (ස්ථිර පදනමින් ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා) හෝ ද්විතීයික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් හා/හෝ බැඳුම්කර මිලට ගැනීමට (ස්ථිර පදනමින් ද්‍රවශීලතාව ලබාදීම සඳහා) ස්ථිර පදනම මත වූ වෙන්දේසි පැවැත්වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට තීරණය කළ හැක. සියලුම සහභාගිත්ව ආයතනවලට ස්ථිර පදනම මත වන වෙන්දේසි සඳහා ප්‍රවේශ විය හැකිය.

87.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය අනුව, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි පැවැත්වීම පිළිබඳව එම වෙන්දේසි පවත්වනු ලබන දිනයේ 09:30 පැය වනවිට හෝ ඊට පෙර ව්‍යාපාරික දිනයේදී මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා අවම වශයෙන්, වෙන්දේසි

පැවැත්වීමට දිනකට පෙර වන ව්‍යාපාරික දිනයේදී, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. අදාළ වෙන්දේසියේ වර්ගය (නිත්‍ය පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම හෝ මිලට ගැනීම), ඉදිරිපත් කරනු ලබන/පිරිනමන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම), පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීම් කටයුතු සිදුවන දිනය යනාදියෙන් මෙම ප්‍රකාශය සමන්විත වේ. ස්ථිර පදනම මත සිදුවන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසිය පැවැත්වූ දිනට පසු පළමු ව්‍යාපාරික දිනයේදී සිදු කරනු ලැබේ.

88.0 සෑම සහභාගිත්ව ආයතනයක් විසින්ම උපරිමය ලංසු 6 කට යටත්ව ඇමුණුමෙහි දක්වා ඇති කාලසීමාවන්ට යටත්ව ලංසු තැබීම සිදු කළ යුතු අතර ලංසු තැබිය හැකි මුළු වටිනාකම අදාළ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ වටිනාකමට සීමා වේ. සෑම ලංසුවක්ම ඔවුන් විසින් මිලදී ගැනීමට හෝ විකිණීමට අදහස් කරන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම, මිලදී ගැනීමට හෝ විකිණීමට අදාළ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල පරිණත කාලසීමාව, මිලදී ගනු ලබන භාණ්ඩාගාර බැඳුම්කරවල කූපන් අනුපාතිකය සහ කූපන් දිනය, අපේක්ෂිත පොලී අනුපාතිකය (ඵලදා අනුපාතිකය) සහ අපේක්ෂිත මිල යනාදියෙන් සමන්විත විය යුතුය.

89.0 අදාළ වෙන්දේසිය පවත්වා අවසාන වී පැය 3 කින් පසුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකිණීමේ වෙන්දේසියට අදාළ ප්‍රතිඵල ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගනු ලැබූ ලංසු ප්‍රමාණය සහ එහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය වැනි තොරතුරු ලබා දෙමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය යටතේ නිවේදනය කරනු ලැබේ. අදාළ වෙන්දේසිය පැවැත්වූ දිනයේදී සෑම ලංසු තබන්නෙකුටම (අදාළ ලංසුව ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම) වෙන්දේසියේ ප්‍රතිඵලය සුරැකුම්පතට අදාළ විකුණුම් මිල ගණන් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා දැනුම් දෙනු ලැබේ.

## 7.1 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකිණීමේ වෙන්දේසි

90.0 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසියකදී භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර මිලට ගැනීමට අදහස් කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් අදාළ වෙන්දේසි නිවේදනයට අනුරූපව ඔවුන්ගේ ලංසුව අදාළ වෙන්දේසි දිනයේදී විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

91.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරන ලද පොලී අනුපාතිකවල (ඵලදා අනුපාතික) ආරෝහණ පිළිවෙළට පදනම්ව විකිණීම සිදු කරනු ලැබේ.

92.0 පියවීම් දිනයේදී, ලංකාසෙට්ල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම හරහා අදාළ පියවීම් කටයුතු සිදු කරනු ලබයි. පියවීම් දිනයේ 08:30 පැයේදී හෝ ඊට පෙර විකුණන ලද

සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පියවීමේ ගිණුමට ලැබීමත් සමග ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සාර්ථක ලංසුකරුවන්ගේ ස්වකීය ගිණුම්වලට විකුණන ලද සුරැකුම්පත් මාරු කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

93.0 විකුණන ලද සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම ගණනය කිරීමේදී සාර්ථක වූ ලංසුකරුවන් විසින් භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු තබන ලද පොලී අනුපාතිකය (ඵලදා අනුපාතිකය), සහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර පරිණත වන දිනය යනාදිය පදනම් කරගනු ලබයි.

## 7.2 භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ස්ථිර පදනම මත මිලදී ගැනීමේ වෙන්දේසි

94.0 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ වෙන්දේසියකදී භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර විකිණීමට අදහස් කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් අදාළ වෙන්දේසි නිවේදනයට අනුරූපව ඔවුන්ගේ ලංසුව අදාළ වෙන්දේසි දිනයේදී විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

95.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතිකවල (ඵලදා අනුපාතික) අවරෝහණ ක්‍රමයට පදනම්ව අදාළ මිලදී ගැනීම් සිදු කරනු ලබයි.

96.0 ගනුදෙනු පියවීම, ලංකාසෙට්ල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) යටතේ සිදු කරනු ලබයි. පියවීම් දිනයේ 08:30 පැයේදී හෝ ඊට පෙර මිලදී ගන්නා සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ස්වකීය Own Account ගිණුමට ලැබීමත් සමඟ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම අදාළ සාර්ථක ලංසු තැබූ සහභාගිත්ව ආයතනවල පියවීමේ ගිණුමට බැර කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

97.0 සාර්ථක වූ ලංසුකරුවකු විසින් භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු තබන ලද පොලී අනුපාතික (ඵලදා අනුපාතිකය) සහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර පරිණත වන දිනය පදනම් කොට ගෙන මිලදී ගනු ලබන සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම ගණනය කරයි.

## 8 වන කොටස : මහ බැංකු සුරැකුම්පත්

98.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල ඇතිවන අවශ්‍යතාවන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් (මහ බැංකු සුරැකුම්පත්) නිකුත් කිරීම තීරණය කරනු ඇත. මේවා නිකුත් කරනු ලබන්නේ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (422 ඡේදයෙහි) 91 (1) (ආ) කොටස යටතේ වෙළඳපොළෙහි ඇති අතිරික්ත ද්‍රවශීලතාව උකහා ගැනීම සඳහා සිදු කරන විවට වෙළඳපොළ කටයුතුවල කොටසක් ලෙසිනි.

99.0 ශ්‍රී ලංකා මහ බැංකුවට

(i) වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම.

(ii) වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නියමිත පරිණත කාලයට පෙර පියවීම.

(iii) මහ බැංකු සුරැකුම්පත් නැවත විකිණීමේ (Sell-back) පහසුකම භාවිතා කිරීම යනාදී තීරණ ගත හැකිය.

100.0 මෙම සුරැකුම්පත්වල ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් පරිදි වෙයි.

(i) මහ බැංකුව සුරැකුම්පත් නිර්ලේඛන සුරැකුම්පත් ලෙස නිකුත් කරනු ලබයි.

(ii) මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු කළ හැකිය.

(iii) මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු පියවීමේදී සහ හුවමාරු කිරීමේදී, නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ මධ්‍යම තැන්පතු පද්ධතිය සඳහා අදාළ වන නීති හා රෙගුලාසි අදාළ වනු ඇත.

(iv) මහ බැංකු සුරැකුම්පත් වෙළඳපොළෙහි ගනුදෙනු කළ හැක. එහෙත් මෙම සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ එක්දින ද්‍රවශීලතා පහසුකම, නිත්‍ය ණය පහසුකම හෝ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා ඇප වශයෙන් භාවිතා කළ නොහැක.

(v) රජයේ භාණ්ඩාගාර බිල්පත් මෙන්ම මහ බැංකු සුරැකුම්පත් ද නිකුත් කරනු ලබන්නේ වට්ටමක් සහිතවය.

(vi) සහභාගිත්ව ආයතන මෙම සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මිලදී ගැනීමට සුදුසුකම් ලබයි. මහජනතාවට මෙම සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළෙහි සහභාගිත්ව ආයතනවලින් මිලදී ගත හැකිය.

(vii) රජයේ සුරැකුම්පත් මෙන්ම, මෙම සුරැකුම්පත් ද ප්‍රාථමික වෙළඳපොළ නිකුතුවේදී පොලී මත රඳවා ගැනීමේ බද්දට යටත් වනු ඇත.

(viii) මහ බැංකු සුරැකුම්පත්වල පරිණත කාලසීමාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබයි.

## 8.1 වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම (කෙටිකාලීන හා දිගුකාලීන)

101.0 මහ බැංකුව සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වෙන්දේසියක් පැවැත්වීම සම්බන්ධව වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය අදාළ වෙන්දේසිය පවත්වනු ලබන දින හෝ ඊට පෙර ප්‍රථම ව්‍යාපාරික දිනයේදී නිවේදනය කරනු ලැබේ. අදාළ වෙන්දේසි වර්ගය (කෙටිකාලීන හෝ දිගුකාලීන), පිරිනමනු ලබන සුරැකුම්පත්වල වටිනාකම (මුහුණත අගය) සහ විකිණීමට බලාපොරොත්තු වන සුරැකුම්පත්වල පරිණත කාල සීමාව, වෙන්දේසිය පවත්වනු ලබන දිනය, වේලාව සහ එහි පියවීම් දිනය නිවේදනයේ ඇතුළත් වේ

102.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ යුත්තේ කෙටිකාලීන පරිණත කාලයකින් ද දිගුකාලීන පරිණත කාලයකින් ද යන්න තීරණය කරනු ලබයි.

කෙටිකාලීන මහ බැංකු සුරැකුම්පත් දින 1-7 දක්වා ද දිගුකාලීන මහ බැංකු සුරැකුම්පත් දින 7 ට වඩා වැඩි පරිණත කාලයකින් ද සමන්විත වේ.

103.0 මෙම වෙන්දේසි ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි මෙන් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා පවත්වනු ලබයි. අදාළ වෙන්දේසියේදී මහ බැංකු සුරැකුම්පත් මිලදී ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විසින් ඔවුන් මිලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට අනුව තමන්ගේ ලංසු තැබීම් (මිලදී ගැනීමට බලාපොරොත්තු වන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) සහ වෙන්දේසිය පවත්වනු ලබන දිනට ලංසු තබන පොලී අනුපාතිකය (ඵලදා අනුපාතිකය) වෙන්දේසි නිවේදනයෙහි දක්වා ඇති කාලසීමාව තුළදී අදාළ විකුණුම් වෙන්දේසිය තෝරා ගනිමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

104.0 යම් සහභාගිත්ව ආයතනයකට යම් පරිණත කාලසීමාවක් සඳහා උපරිම ලංසු 6 ක් ඉදිරිපත් කළ හැකි අතර, එම ලංසුවල මුළු වටිනාකම වෙන්දේසියේදී ඉදිරිපත් කරනු ලබන මුළු වටිනාකමට සීමා විය යුතුය.

105.0 සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතික (ඵලදා අනුපාතික) රඳවා තබා ගැනීමේ බදු ඇතුළත් ඵලදා අනුපාතිකයක් වේ. රජයේ බදු පද්ධතියෙහි සිදුවන ඕනෑම වෙනසක් සුදුසු පරිදි අදාළ වේ.

106.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතික (ඵලදා අනුපාතික) ආරෝහණ ක්‍රමයට පෙළගස්වා ඒ මත පදනම්ව අදාළ වෙන් කිරීම් සිදු කරනු ලබයි.

107.0 ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගනු ලැබූ ලංසු ප්‍රමාණය සහ එහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය වැනි තොරතුරු ලබා දෙමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ ක්‍රමය යටතේ අදාළ වෙන්දේසිය පවත්වා අවසාන වී විනාඩි 30 කින් පසුව ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. අදාළ වෙන්දේසිය පැවැත්වූ දිනයේ දී සෑම ලංසු තබන්නෙකුටම (අදාළ ලංසුව ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම) එහි ප්‍රතිඵලය සුරැකුම්පතට අදාළ ගැනුම් මිල ගණන් ද රඳවා තබා ගැනීමේ බදු ද සමග අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30 කට පසුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් දැනුම් දෙනු ලැබේ.

108.0 සෑම සාර්ථක ලංසුවකම විකුණුම් මිල (රඳවා තබා ගැනීමේ බදු සහිතව) අදාළ සුරැකුම්පතේ පරිණත කාලසීමාව සඳහා රඳවා තබා ගැනීමේ බදු ගැලපීමෙන් පසුව අදාළ සහභාගිත්ව ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පොලී අනුපාතික (ඵලදා අනුපාතික) අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම මත වට්ටම් කොට ගණනය කරනු ලැබේ.

109.0 ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පැයක් ඇතුළත ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ සහභාගිත්ව ආයතනවලට පිළිගනු ලැබූ වටිනාකම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා

ගැනීමේ අංකය, මුහුණත වටිනාකම සහ පරිණත කාලසීමාව පිළිබඳ තහවුරුවක් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් නිකුත් කරනු ලබයි.

110.0 ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම හරහා අදාළ පියවීම් කටයුතු සිදුකරනු ලැබේ. පියවීම් සිදු කරනු ලබන දිනයේදී පහත 111.0 වන වගන්තියේ සඳහන් කොට ඇති කාලසීමාවන්ට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීමේ ගිණුම්වලට සුරැකුම්පත් විකිණූ වටිනාකම (රඳවා තබාගැනීමේ බදු සහිතව විකුණන ලද සුරැකුම්පත්වල වට්ටම් වටිනාකම) ලැබීමත් සමග විකුණන ලද සුරැකුම්පත්වල මුහුණත වටිනාකම අදාළ සහභාගිත්ව ආයතනයේ ස්වකීය ගිණුම්වලට (Own Account) හුවමාරු කරමින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ පියවීම් කටයුතු සිදු කරනු ලැබේ.

111.0 පියවීම් කාලසීමාවන් පහත පරිදි වේ.

(i) කෙටිකාලීන පරිණත කාලසීමාවන් සහිත මහ බැංකු සුරැකුම්පත්වල පියවීම් කටයුතු වෙන්දේසි දිනයේදී අදාළ වෙන්දේසිය අවසාන වී පැය දෙකක් ඇතුළත සිදු කරනු ලැබේ.
(ii) දිගුකාලීන පරිණත කාලසීමාවක් සහිත මහ බැංකු සුරැකුම්පත්වල පියවීම් කටයුතු අදාළ පියවීම් දිනයේ 08:30 පැය වන විට සිදු කරනු ලබයි.

112.0 පරිණත වන දිනයේදී, මහ බැංකුවේ ස්වකීය සුරැකුම්පත් ගිණුමට (own account) අදාළ සුරැකුම්පත් ස්වයංක්‍රීයව මාරුවීම සිදුවන අතර පරිණත වන සුරැකුම්පත්වලට අදාළ ලැබීම් (අදාළ සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) පරිණත දිනයට පෙර පළමු ව්‍යාපාරික දිනයේදී සුරැකුම්පත් තබාගත් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට පරිණත වන දිනයේ 08:30 පැය වන විට බැර කරනු ලැබේ.

## 8.2 පෙර තීරණය කරන ලද අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම

113.0 මහ බැංකුව විසින් පෙර තීරණය කරන ලද එලදා අනුපාතිකයකට සහභාගිත්ව ආයතනවලට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ හැකිය.

114.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් පරිණතවන කාලසීමාව, එලදා අනුපාතිකය (රඳවා තබාගැනීමේ බදු සහිතව) සහ පරිණතවන දිනය සඳහන් කරමින් කලින් තීරණය කරනු ලබන එලදා අනුපාතිකයකට මහ බැංකු සුරැකම්පත් නිකුත් කිරීමට තීරණය කරනු ලබන අතර, එය විද්‍යුත් මංගත ලංසු තැබීම් ක්‍රමය/මුදල් වෙළඳපොළ අධීක්ෂණ ක්‍රමය හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයක් භාවිතා කොට, අදාළ ව්‍යාපාරික දිනයේ 11:00 සහ 14:30 පැය අතර කාලසීමාවේදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය සමග මිලදී ගැනීමේ ගනුදෙනුවකට එළඹීම සඳහා සහභාගිත්ව ආයතනවලට දන්වනු ලබයි.

115.0 සහභාගිත්ව ආයතන විසින් මෙසේ කලින් තීරණය කරන ළලදා අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් මිලට ගැනීමට අපේක්ෂා කරනු ලබයි නම් එම වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ 14:30 වනවිට මිලදී ගැනීමට බලාපොරොත්තු වන ප්‍රමාණය/වටිනාකම (මුහුණත අගය) සඳහන් කරමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය සමග මිලදී ගැනීමේ ගනුදෙනුවකට එළඹීම සඳහා සහභාගිත්ව ආයතනවලට දන්වනු ලබයි.

116.0 සහභාගිත්ව ආයතනවලට විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය යටතේ (නිත්‍ය පහසුකම, ස්ථිර පදනම යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම) මිලට ගැනීමට බලාපොරොත්තු වන වටිනාකම (මුහුණත වටිනාකම) 15:00 පැය වන විට ඉදිරිපත් කළ යුතුය.

117.0 සහභාගිත්ව ආයතනවලට පිළිගත් ලංසුව පිළිබඳව, විද්‍යුත් ලංසු පද්ධතිය මගින් (නිත්‍ය පහසුකම, ස්ථිර පදනම යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම) එදිනම 15:00 පැය වන විට දැනගත හැක.

118.0 ගනුදෙනු සිදු කරන ලද දිනයේම, පියවීම් යෙදෙන අවස්ථාවන්හිදී සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) ගොනුව ලංකාසෙක්‍යු වෙත එදිනම 15:00 පැයට පෙර ඉදිරිපත් කරනු ලැබේ. පියවීම් දිනය, ගනුදෙනු කරන ලද දිනයට පසු දිනට යෙදේ නම් සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ ගොනුව ලංකාසෙක්‍යු වෙත ඉදිරිපත් කරනු ලබන්නේ පියවීම් කරන දිනයේ 08:30 පැයට පෙරය.

119.0 විකුණන ලද සුරැකුම්පත්වලට අදාළ පියවීම වට්ටම් කරන ලද විකුණුම් වටිනාකම පියවීම් පද්ධතිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට බැර කරනු ලබන අතර, සහභාගිත්ව ආයතනවල ස්වකීය ගිණුම්වලට (own account) සුරැකුම්පත් හුවමාරු කිරීම සිදු කරනු ලැබේ.

120.0 මෙහිදී සුරැකුම්පත්වල මුහුණත අගය (රඳවා තබා ගැනීමේ බදු සහිත විකුණුම් මිල) අදාළ එලදා පොලී අනුපාතික මත කල්පිරෙන කාලය සඳහා වට්ටම් කරමින්, විකුණුමේ අගය ගණනය කරනු ලැබේ.

121.0 කල්පිරෙන දිනයෙහිදී එයට අදාළ පියවීම් කටයුතු ස්වයංක්‍රීයව සිදු කෙරේ. ඒ සඳහා අදාළ සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ (own account) ගිණුමට ප්‍රේෂණය කර කල්පිරුණු වටිනාකම, කල්පිරීමට පෙර දවසේ එම සුරැකුම්පත් අයත්ව තිබූ සහභාගිත්ව ආයතනයෙහි පියවීම් ගිණුමට බැර කරනු ලැබේ.

122.0 අවශ්‍ය විටකදී පෙර තීරණය කළ පොලී අනුපාතික සහිත වූ මහ බැංකු සුරැකුම්පත්වල එලදා අනුපාතික සහ පරිණත කාලය වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. එවැනි වෙනස්වීම් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය/මුදල් වෙළඳපොළ අධීක්ෂණ

පද්ධතිය හෝ වෙනත් දැනුම් දීමේ ක්‍රමයක් මගින් ඒවා බලපැවැත්වෙන දිනයෙහි 09:30 පැයට පෙර සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

## 8.3 වෙන්දේසි ක්‍රමය යටතේ පරිණත දිනට පෙර මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම

123.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය යැයි හැඟෙන විටකදී මහ බැංකු සුරැකුම්පත් පරිණත දිනයට ප්‍රථම විශ්‍රාම ගැන්වීම පිළිබඳව තීරණය කරනු ඇත.

124. පරිණත දිනයට ප්‍රථම මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම (මිලදී ගැනීම) පිළිබඳ වෙළඳපොළ මෙහෙයුම් කමිටු තීරණය වෙන්දේසිය පැවැත්වෙන දිනයේ හෝ ඊට ප්‍රථම ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන පළමු දිනයේ සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. එම නිවේදනයේ සුරැකුම්පත් ප්‍රමාණය (මුහුණත වටිනාකම), කල්පිරෙන දිනය, මිලදී ගන්නා සුරැකුම්පතේ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය, වෙන්දේසිය පැවැත්වෙන දිනය හා වේලාව සහ පියවීම් සිදුවන දිනය ඇතුළත් වේ.

125.0 සහභාගිත්ව ආයතනයක් අදාළ මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසියකදී සුරැකුම්පත් විකිණීමේදී ලංසුවේ වටිනාකම (විකිණීමට අපේක්ෂා කරන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) සහ පොලී අනුපාතික (ඵලදා) වෙන්දේසි දින පැය 13:00 සහ පැය 14:00 අතර විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය හරහා ස්ථිර පදනම මත මිලදී ගැනීමේ වෙන්දේසි යටතේ අදාළ වෙන්දේසිය තෝරා ලංසු ඉදිරිපත් කළ යුතු වේ. ගනුදෙනු පියවීම එදිනට පසුව එළඹෙන ව්‍යාපාරික දිනයේ පැය 08:30 ට පෙර සිදු කරනු ලැබේ.

126.0 එක් සහභාගිත්ව ආයතනයකට එක් සුරැකුම්පතක් වෙනුවෙන් ලංසු 6 ක් ඉදිරිපත් කළ හැකි අතර ලංසුවල මුළු වටිනාකම අදාළ වෙන්දේසියේ වටිනාකම නොඉක්මවිය යුතුය.

127.0 වෙන්දේසියේදී මිලදී ගැනීම සිදු කරනු ලබන්නේ සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කළ පොලී (ඵලදා) අනුපාතිකයන්ගේ අවරෝහණ පටිපාටියට අනුවය.

128.0 වෙන්දේසියේ ප්‍රතිඵලය වෙන්දේසිය අවසන් වී විනාඩි 30 කට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ලබාදෙනු ලැබේ. මෙහි ඇතුළත් වන්නේ ලැබූ මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් ලංසු ප්‍රමාණය සහ වෙන්දේසියේ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයයි. වෙන්දේසි දිනයේ වෙන්දේසිය අවසන් වී විනාඩි 30 ක් ඇතුළත ලංසුවේ අවසන් ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප කිරීම, පිළිගැනීම හෝ කොටසක් පමණක් පිළිගැනීම) සහ මහ බැංකු සුරැකුම්පත් මිලදී ගන්නා අගය විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඒ ඒ සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

129.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම් (MTF) හරහා වෙන්දේසි දිනයේදී පැය 08:30 ට හෝ ඊට පෙර සිදුවේ. ගෙවීම් සහ පියවීම්

දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමට මාරු කිරීමත් සමඟ සුරැකුම්පත්වල ගැනුම් මිල (මිලදී ගත් මහ බැංකු සුරැකුම්පත්වල වට්ටම් කළ අගය) සහභාගිත්ව ආයතනයේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය යටතේ ඇති පියවීම් ගිණුමට බැර කිරීමෙන් ගනුදෙනුව පියවීම සිදු කෙරේ.

130.0 මහ බැංකු සුරැකුම්පත්වල ගැනුම් මිල ඒ ඒ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කර තිබූ එලදා අනුපාතිකයෙන් මිලදී ගන්නා සුරැකුම්පත්වල මුහුණත වටිනාකම කල්පිරීමට ඉතිරිව තිබෙන කාල සීමාව සඳහා වට්ටම් කිරීම මගින් ගණනය කරනු ලැබේ.

## 8.4 මහ බැංකු සුරැකුම්පත් නැවත විකිණීමේ පහසුකම සහ පෙර තීරණය කරන ලද අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම

131.0 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් පහසුකම් සහභාගිත්ව ආයතන වෙත ලබාදෙනු ලැබේ.

(අ) ඔවුන් සතු මහ බැංකු සුරැකුම්පත් පරිණත වීමට පෙර, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නැවත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම.

(ආ) පරිණත වීමට පෙර, කලින් තීරණය කරන ලද අනුපාතිකයකට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම (මිලදී ගැනීම).

132.0 131.0 (අ) අනුව සහභාගිත්ව ආයතනයකට ශ්‍රී ලංකා මහ බැංකු නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ අදාළ මහ බැංකු සුරැකුම්පතේ ඉතිරි පරිණත කාලයට වට්ටම් කළ මිලකට මහ බැංකු සුරැකුම්පත් පරිණත වීමට පෙර නැවත විකිණීමට හැක. 131.0 (ආ) අනුව ශ්‍රී ලංකා මහ බැංකුව පෙර තීරණය කරන ලද එලදා අනුපාතිකයකට පරිණත වීමට පෙර විශ්‍රාම ගැන්වීමට තීරණය කරනු ලබයි. එහිදී පොලී අනුපාතිකය කල් පිරෙන දිනය සහ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය නිවේදනය කරනු ලැබේ.

133.0 මෙම පහසුකම භාවිතා කිරීමට කැමති සහභාගිත්ව ආයතන නැවත විකිණීමට බලාපොරොත්තු වන මහ බැංකු සුරැකුම්පත්හි මුහුණත අගය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය වෙත එදිනම පැය 15:15 ට පෙර දුරකථන මාර්ගයෙන් හෝ ෆැක්ස් මාර්ගයෙන් දැනුම් දිය යුතු වේ.

134.0 සහභාගිත්ව ආයතන ගනුදෙනුව (විකුණනු ලබන ප්‍රමාණය සහ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය) එදින පැය 15:15 ට පෙර විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියේ ස්ථිර පදනමක් මත මිලදී ගැනීම යටතේ තහවුරු කළ යුතු වේ. මීට අදාළ පියවීම් කටයුතු එදිනම T+0 සිදු කරනු ලැබේ.

135.0 ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ලංසු ප්‍රමාණය ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය, මුහුණත වටිනාකම සහ එලදා අනුපාතිකය ලබා දෙමින් ගනුදෙනුව තහවුරු කිරීම 16:15 පැය වන විට විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලබයි.

136.0 මහ බැංකු සුරැකුම්පත් මිලදී ගැනීමේ අගය (මිලදී ගැනීමේ වටිනාකම) සුරැකුම්පත්වල මුහුණත අංගය 131 (අ) හිදී ශ්‍රී ලංකා මහ බැංකු නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙන් ද 131 (ආ) හිදී පෙර තීරණය කරන ලද පොලී අනුපාතිකයෙන් ද සුරැකුම්පත් කල්පිරීමට ඉතිරිව තිබෙන කාලසීමාව සඳහා වට්ටම් කිරීමෙන් ගණනය කරනු ලැබේ.

137.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (lankasettle) සැසඳු ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) හරහා සිදු කරනු ලැබේ. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් මිලදීගත් සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් ගිණුමට (own account) මාරු කිරීමත් සමගම සුරැකුම්පත්වල ගැනුම් මිල (මිලදී ගත් මහ බැංකු සුරැකුම්පත්වල වට්ටම් කළ මිල) අදාළ සහභාගිත්ව ආයතනයන්ගේ පියවීම් ගිණුමට පැය 16:15 වන විට මාරු කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

## 9 වන කොටස : විදේශ විනිමය හුවමාරු ගනුදෙනු

138.0 මෙම කොටසේ අඩංගු ක්‍රියාමාර්ග, මාර්ගෝපදේශ, නියමයන් සහ කොන්දේසි අදාළ වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පමණි.

139.0 මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් උපකරණයක් ලෙස වෙළඳපොළ තුළින් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට හෝ සැපයීමට විදේශ විනිමය හුවමාරු ගනුදෙනු (Foreign Exchange Swap transcation) පැවැත්වීමට වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කිරීමට ඉඩ ඇත. මෙහිදී එක් ව්‍යවහාර මුදල් වර්ගයකට එරෙහිව වෙනත් ව්‍යවාහාර මුදල් වර්ගයක් යම්කිසි දිනයකදී මිලදී ගෙන අනාගත දිනයකදී නිශ්චිත අනුපාතිකයකට එම ව්‍යවහාර මුදල් වර්ගය නැවත හුවමාරු කර ගැනීම සඳහා ගිවිසුමකට යටත් වීමක් සිදුවේ. විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ප්‍රතිමිලදීගැනුම් ගිවිසුම්වලට සමාන වන නමුත් සුරැකුම් වශයෙන් රජයේ සුරැකුම්පත් වෙනුවට විදේශ විනිමය භාවිතා කරනු ලැබේ.

140.0 සියලුම විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සිදු කරනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා මහ බැංකුව අතර වේ. විවට වෙළඳපොළ කටයුතු යටතේ මහ බැංකුව දෙයාකාරව විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා ඇතුළත් වනු ලැබේ.

(අ) විකුණුම් - ගැනුම් විදේශ විනිමය හුවමාරු

(ආ) ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු

141.0 මෙම කොටසේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි විකුණුම් - ගැනුම් සහ ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු යන දෙවර්ගයම සඳහා අදාළ වේ.

142.0 විකුණුම් - ගැනුම් සහ ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු උපරිම වශයෙන් දින 365 කට සීමා වේ.

143.0 විකුණුම් - ගැනුම් හෝ ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි පැවැත්වීම පිළිබඳ වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසිය පැවැත්වෙන දින පැය 09:30 ට පෙර හෝ ඊට ප්‍රථම ව්‍යාපාරික දිනයේදී නිවේදනය කරනු ලැබේ. එම නිවේදනයේ වෙන්දේසියේදී පිරිනමනු ලබන ප්‍රමාණය, වෙන්දේසිය සිදු කරනු ලබන දිනය, පරිණත කාලය සහ පළමු අදියරේ පියවීම් දිනය සහ දෙවන අදියරෙහි පරිණත දිනය ඇතුළත් වේ.

144.0 බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට එළඹීමට අපේක්ෂා කරන්නේ නම් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවැරදි වෙන්දේසි නිවේදනය තෝරා වෙන්දේසි දිනයේදී ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

145.0 විදේශ විනිමය හුවමාරු වෙන්දේසි සඳහා වෙන්දේසි දිනයේදී පැය 13:00 ත් පැය 14:00 ත් අතර ලංසු ඉදිරිපත් කළ හැකි වේ.

146.0 එක්සත් ජනපද ඩොලර්වලින් පමණක් ලංසු භාරගනු ලැබේ.

147.0 එක් ටෙන්ඩරයක් වෙනුවෙන් උපරිම වශයෙන් ලංසු 6 ක් ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හැකියාව ඇත. ලංසුවක අවම වටිනාකම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියනයක් ($1,000,000) වන අතර, ලංසුවක් එක්සත් ජනපද ඩොලර් ලක්ෂයක ($100,000) ගුණාකාර විය යුතුය. සෑම ලංසුවකම එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය සහ හුවමාරු අංක (SWAP points) (විචල්‍ය අනුපාතික ටෙන්ඩර්) ඇතුළත් විය යුතුය.

148.0 හුවමාරු අංක විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියට ඇතුළත් කළ යුත්තේ දශමස්ථාන දෙකක් සහිත රුපියල් ශතවලිනි. උදා: 0.20 = ශත විස්සයි.

149.0 ලංසු වෙන් කිරීම සිදු වන්නේ සාර්ථක ලංසු තැබූවන් විසින් ඉදිරිපත් කළ හුවමාරු අංක පදනම් කර ගැනීමෙනි.

150.0 වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණය ඉක්මවා සමාන හුවමාරු අංකයකට ලංසු ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හිදී විකුණුම් - ගැනුම් සහ ගැනුම් - විකුණුම් විනිමය හුවමාරු සඳහා ඉතිරි වී තිබෙන ප්‍රමාණය සමානුපාතික වන අනුපාතික පදනම මත අදාළ ලංසු තැබූ ආයතන වෙත වෙන් කරනු ලැබේ. ඒ අනුව, එම හුවමාරු අංකයට ඉදිරිපත් වූ ලංසුවලින් කොටසක් පමණක් පිළිගෙන තිබිය හැක.

151.0 විදේශ විනිමය හුවමාරු වෙන්දේසියේ ප්‍රතිඵල වෙන්දේසි දින, වෙන්දේසිය අවසන් වී විනාඩි 30 කට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් ප්‍රමාණය සහ වෙන්දේසියේ බරිත සාමාන්‍ය, විදේශ විනිමය ගිවිසුම් හුවමාරු අංකය ලබාදෙමින් සිදු කරනු ලැබේ.

152.0 ලංසු තැබූවන් හට ඔවුන්ගේ ලංසුවේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පමණක් පිළිගැනීම) සමග පිළිගත් ප්‍රමාණය විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය හරහා වෙන්දේසි දින වෙන්දේසිය අවසන් වී විනාඩි 30 කට පසු දැනුම් දෙනු ලැබේ.

153.0 විදේශ විනිමය හුවාමාරු ගනුදෙනු පිළිබඳ තහවුරු කිරීමක් සෑම සාර්ථක ලංසු තැබූවෙකු හටම වෙන්දේසි ප්‍රතිඵලය නිකුත් කිරීමෙන් පැයකට පසු විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය හරහා පිළිගත් ප්‍රමාණය, පරිණත කාලය, පරිණත දිනය සහ හුවමාරු අංක ලබා දෙමින් සිදු කරනු ලැබේ.

154.0 ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විකුණුම් - ගැනුම් හෝ ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු සිදු කරනු ලබන අතර, සෑම සාර්ථක ලංසු තැබූවෙකු හටම ගනුදෙනු තහවුරු කිරීමත් සිදු කරනු ලැබේ.

155.0 විකුණුම් - ගැනුම් හෝ ගැනුම් - විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු පියවීමේ ක්‍රියාපිළිවෙළ අනෙකුත් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු පියවීමේ ක්‍රියාපිළිවෙළටම සමාන වේ.

**අධ්‍යක්ෂ**
**දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව**

**ඇමුණුම**

## විවට වෙළඳ කටයුතු සඳහා යොදා ගැනෙන උපකරණ සහ කාලසටහන

| උපකරණ | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **තොරතුරු** | **කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි** | **කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම** | **දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි** | **ස්ථිර පදනම මත විකිණීම/මිලට ගැනීම** | **දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම** | **විදේශ විනිමය හුවමාරු ගිවිසුම්** | **නිත්‍ය පහසුකම්** | **මහ බැංකු සුරැකුම්පත්** |
| වෙන්දේසි කාලය | 10:00-10:30 පැය | 11:00 – 11:30 පැය | 13:00 – 13:30 පැය | 13:00 – 14:30 පැය | 14:00 – 14:30 පැය | 13:00 – 14:00 පැය | නිමවන වේලාව 15:30 පැය | නිකුතු - 11:00 – 14:30 පැය<br>විශ්‍රාම ගැන්වීම - 13:00 – 14:00 පැය |
| විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියේ පියවීම් | T+0 | T+0 | T+1 | T+1 | T+1 | T+2 | T+0 | 15:00 පැය වන විට |
| පියවීම් කාලය | 13:15 පැය වන විට | 13:15 පැය වන විට | T+1 08:30 පැය වන විට | T+1 08:30 පැය වන විට | T+1 08:30 පැය වන විට | T+2 | නිත්‍ය තැන්පතු පහසුකම - 16:00 පැය වන විට<br>නිත්‍ය ණය පහසුකම් - 16:15 පැය වන විට | 08:30 පැය වන විට ... පහසුකම - T+0 16:15 පැය වන විට<br>විශ්‍රාම ගැන්වීම T+1 08:30 පැය වන විට |
| කල්පිරෙන දින පියවීම් කටයුතු | ප්‍රතිමිලදීගැනුම් 08:00 පැය වන විට<br>ප්‍රතිවිකුණුම් 11:00 පැය වන විට | 11:00 පැය වන විට | ප්‍රතිමිලදීගැනුම් 08:00 පැය වන විට<br>ප්‍රතිවිකුණුම් 11:00 පැය වන විට | අදාළ නොවේ | 11:00 පැය වන විට | ව්‍යාපාර කටයුතු නිම වන විට | නිත්‍ය තැන්පතු පහසුකම - 08:00 පැය වන විට<br>නිත්‍ය ණය පහසුකම් - 11.00 පැය වන විට | 08:30 පැය වන විට |
| පාර්ශ්වකරුවන් | බලපත්‍රලාභී වාණිජ බැංකු/සේවක අර්ථසාධක අරමුදල | බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් | බලපත්‍රලාභී වාණිජ බැංකු/සේවක අර්ථසාධක අරමුදල | බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල | බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් | බලපත්‍රලාභී වාණිජ බැංකු | බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල | බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල |
| කාලසීමාව | දින 1 - 7 | දින 1 - 7 | දින 7 ට වඩා වැඩි | අදාළ නොවේ | දින 7 ට වඩා වැඩි | වසරක් දක්වා | එක් දින | වසරක් දක්වා |